// masthead
# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 2,470 - 2026 ජනවාරි මස 02 වැනි සිකුරාදා - 2026.01.02

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)

## IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)


| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| තනතුරු ඇබෑර්තු ... ... | 26 | පළාත් පාලන සහ ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම් ... ... | — |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... | — | ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන ... ... | — |
| බඩුබාහිරාදිය විකිණීම් ... ... | — | අයවැය ලේඛන ... ... | — |
| පළාත් පාලන නිවේදන ... ... | 30 | දේපළ විකිණීම් ... ... | — |
| අතුරු ව්‍යවස්ථා ... ... | — | විවිධ දැන්වීම් ... ... | — |


**සතිපතා නිකුත් වන *ගැසට්* පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

**වැදගත් නිවේදනයයි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට්* පත්‍රයේ අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට්* පත්‍රය පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2026 ජනවාරි මස 23 දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2026 ජනවාරි 09 දින දහවල් 12.00ට හෝ ඊට පෙර) තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය

"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් *ගැසට් පත්‍රයේ* පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට් පත්‍රයක* පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."

2026 ජුනි මස 02 දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

**එස්. ඩී. පාඩිකෝරාළ,**
රජයේ මුද්‍රණාලයාධිපති. *(වැ.බ.)*

මෙම *ගැසට් පත්‍රය* www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

25 - B 082752 — (2026/01)
F 1 -

# තනතුරු - ඇබෑර්තු

## නාවලපිටිය නගර සභාව

### නාවලපිටිය නගර සභාවේ ප්‍රාථමික මට්ටමේ අර්ධ ශිල්පීය හා ශිල්පීය නොවන තනතුරුවල පුරප්පාඩු සඳහා දෛනික වැටුප් මත බඳවා ගැනීම

නාවලපිටිය නගර සභාවේ දැනට පුරප්පාඩු වී ඇති පහත උපලේඛනයේ තනතුරුවලට බඳවා ගැනීමට මධ්‍යම පළාත් සභා බල ප්‍රදේශයේ පදිංචිකරුවන්ගේ අයදුම්පත් කැඳවනු ලැබේ.

01. **බඳවා ගැනීමේ පොදු සුදුසුකම් :**

- අයදුම්කරු ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතු අතර විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.
- අයදුම්කරු බල ප්‍රදේශයේ වසර 03 කට නොඅඩු ස්ථිර පදිංචි අයෙකු විය යුතුය.
- අයදුම්කරු, අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 18ට නොඅඩු හා වයස අවුරුදු 45ට නොවැඩි විය යුතුය.
- අයදුම්පත් කැඳවීමෙන් පසු හෝ කැඳවන අතරතුර කාලසීමාවේදී හෝ මෙම බඳවා ගැනීම ප්‍රමාද කිරීම හෝ වෙනස් කිරීම හෝ මෙම නිවේදනය අවලංගු කිරීම හෝ සංශෝධනය කිරීම නාවලපිටිය නගර සභාවේ ලේකම්වරයා සතුය.
- බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියළුම සුදුසුකම්, එම සුදුසුකම් සම්පූර්ණ කර තිබිය යුතු බවට අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ / *ගැසට් පත්‍රයේ* සඳහන් කරනු ලබන දිනට සෑම ආකාරයෙන් ම සම්පූර්ණ කර තිබිය යුතුය.
- සෑම අපේක්ෂයෙකුම මනා ඇස් පෙනීමක් සහ ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් හා යහපත් චරිතයකින් යුක්ත විය යුතු අතර දිවයිනේ කවර ප්‍රදේශයක වුවද සේවය කිරීමට සුදුසු ශරීර සෞඛ්‍යයකින් යුක්ත විය යුතුය.

01.1 **අධ්‍යාපන සුදුසුකම් :**

| *අනු අංකය* | *තනතුරු නාමය* | *සේවා ශ්‍රේණිය* | *අධ්‍යාපන සුදුසුකම්* | *පුරප්පාඩු ගණන* |
|---|---|---|---|---|
| 01 | ආදාහනාගාර ක්‍රියාකරු | ප්‍රාථමික අර්ධ ශිල්පීය | අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේ දී දෙවරකට නොවැඩි වාර ගණනක දී යටත් පිරිසෙයින් විෂයයන් 02 කට සම්මාන සහිතව විෂයයන් 06ක් සමත්ව තිබීම හෝ ජාතික වෘත්තීය සුදුසුකම් හී (NVQ)3 සුදුසුකම ලබා තිබීම. (රා.ප.ච.28/2016 අනුව)<br><br>*මාස 06කට නොඅඩු පළපුරුද්දක් ලබා තිබිය යුතුය. | 01 |
| 02 | සෞඛ්‍ය කම්කරු | ප්‍රාථමික ශිල්පීය නොවන | - අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේ දී දෙවරකට නොවැඩි වාර ගණනක දී යටත් පිරිසෙයින් විෂයයන් 02 කට සම්මාන සහිතව විෂයයන් 06ක් සමත්ව තිබීම, මින් විෂයයන් 05 ක් එක් වරක දී සමත් වී තිබිය යුතුයි.<br><br>(*- මෙම පරිපාටියේ සඳහන් සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් නොමැති අවස්ථාවලදී පරිපාටියේ සඳහන් සුදුසුකම 5 ශ්‍රේණිය සමත්වීම දක්වා අඩුකර බඳවා ගැනීමට කටයුතු කරනු ලැබේ.) | 01 |

02. **සේවයේ නියුක්ත කිරීමේ කොන්දේසි :**

02.1 මෙම තනතුර තාවකාලික තනතුරකි.(නාවලපිටිය නගර සභාවේ ලේකම් විසින් ඉදිරියේ දී ගනු ලබන තීරණයකට ඔබ යටත් විය යුතුය.)

02.2 ස්ථිර පත්වීමක් ලබා දීමට සුදුසුකමක් නොවන බව සැලකිය යුතුය.

02.3 සේවය කරන දින සඳහා පමණක් දෛනික දීමනා ගෙවීම් කරයි.

02.4 **වැටුප් පරිමාණය :**

| *තනතුර* | *වැටුප් කේතය* | *වැටුප් පරිමාණය* |
|---|---|---|
| ආදාහනාගාර ක්‍රියාකරු | PL2 - 10/2025 | දෛනික දීමනා<br>(මූලික වැටුප + ජීවන වියදම් දීමනා ) / දින 30) * සේවය කළ දින ගණන<br>• සේවක අර්ථසාධක හා සේවා නියුක්ති භාර අරමුදල් සඳහා දායකත්වය හිමි වේ. |
| සෞඛ්‍ය කම්කරු | PL1 - 10/2025 | |

03. **බඳවා ගැනීමේ ක්‍රමය :**

අයදුම්පත් ඉදිරිපත් කර ඇති හා බඳවා ගැනීමට අවශ්‍ය අවම සුදුසුකම් සහිත අයදුම්කරුවන් සියළුම දෙනා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකට යොමු කර එහි දී ලබා ගන්නා ලකුණු අනුපිළිවෙලට අනුව, පුරප්පාඩුවලට බඳවා ගනු ලැබේ.

සම්මුඛ පරීක්ෂණයකට ඉදිරිපත් වූ අයදුම්කරුවන් අතරින් පුරප්පාඩු වී පවත්නා තනතුරු සංඛ්‍යාවට සමාන වඩාත් සුදුසුකම් සහිත අයදුම්කරුවන් සංඛ්‍යාවක් තෝරාගෙන බඳවා ගැනීම් කෙරේ.

04. **අයදුම්කළ යුතු ආකාරය :**

මෙම නිවේදනයේ ආදර්ශ ආකෘතිය පරිදි අගල් 12x8 ප්‍රමාණයේ අයදුම්පත් සකස් කරන තනතුර අදාළ කවරයේ වම්පස ඉහළ කෙළවරේ ලියා **2026.01.16** වැනි දිනට පෙර "ලේකම්, නගර සභාව, නාවලපිටිය යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. නියමිත දිනට නොලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත් සමඟ පහත සඳහන් ලියකියවිලිවල සහතික කළ පිටපත් එවිය යුතුය :

1. උප්පැන්න සහතිකය
2. අධ්‍යාපන සහතික හා ශිෂ්‍ය කාර්ය දර්ශකය
3. හැඳුනුම්පතේ ඡායා පිටපතක්
4. පදිංචිය සනාථ කිරීමේ සහතිකය
5. මෑතක දී ගත් චරිත සහතික 02 ක් හා පොලිස් වාර්තාව
6. ආදාහනාගාර ක්‍රියාකරු සඳහා පළපුරුද්ද සහිත සහතිකය

මෙම නිවේදනයේ සිංහල, දෙමළ අනුවාදයන් අතර කිසියම් අනනුකූලතාවයක් පවතී නම්, සිංහල නිවේදනයට අනුව අදාළ කරුණු බලපැවැත්වේ.

ලේකම්,
නගර සභාව, නාවලපිටිය.

2025 දෙසැම්බර් මස 18 දින,
නාවලපිටිය නගර සභාවේදී ය.

**ආදර්ශ අයදුම්පත්‍රය**

**නාවලපිටිය නගර සභාවේ ප්‍රාථමික මට්ටමේ අර්ධ ශිල්පීය හා ශිල්පීය නොවන තනතුරු සඳහා දෛනික පදනම මත බඳවා ගැනීමට ඉල්ලුම් කිරීමේ අයදුම්පත්‍රය**

තනතුර -......................................

1. මුලකුරු සමඟ නම : ..........................................................................................................
2. සම්පූර්ණ නම : ..........................................................................................................
3. ජාතික හැඳුනුම්පත් අංකය :.............................................................
4. උපන් දිනය : ............................. වර්ෂය :.............මාසය :............... දිනය :...........
5. අයදුම්පත් භාර ගන්නා දිනට වයස : අවුරුදු:.................. මාස :................... දින :..................
6. ස්ත්‍රී/පුරුෂ භාවය :....................................... දුරකථන අංකය : ..........................................
7. විවාහක/අවිවාහක බව :.........................................
8. ජාතිය :........................................
9. ස්ථිර ලිපිනය :..........................................................................................................
10. ඔබ ශ්‍රී ලංකා පුරවැසියෙක් ද? එසේ නම් පරම්පරාවෙන් ද? ලියාපදිංචියෙන් ද? යන බව :......................

11. අධ්‍යාපන සුදුසුකම් :

අ.පො.ස. (සා.පෙළ) විභාගය පිළිබඳ විස්තර

<u>පළමු වතාව</u>
වර්ෂය හා මාසය :...............................
විභාග අංකය :....................................

<u>දෙවන වතාව</u>
වර්ෂය හා මාසය :....................................
විභාග අංකය :..........................................

| *විෂයය* | *ශ්‍රේණිය* | *විෂයය* | *ශ්‍රේණිය* |
|---|---|---|---|
| 1 | | 1 | |
| 2 | | 2 | |
| 3 | | 3 | |
| 4 | | 4 | |
| 5 | | 5 | |
| 6 | | 6 | |
| 7 | | 7 | |
| 8 | | 8 | |

12. වෘත්තීය සුදුසුකම් :..........................................................................................................................................
..........................................................................................................................................

13. පළපුරුද්ද :..........................................................................................................................................

මෙම අයදුම්පත්‍රයේ මා විසින් සපයන ලද තොරතුරු සත්‍ය හා නිවැරදි බවට මෙයින් සහතික කරමි. මෙහි ඇතුළත් තොරතුරු කිසිවක් අසත්‍ය බව මා මෙම තනතුරට තෝරා ගැනීමට පෙර අනාවරණය වුවහොත් මා නුසුදුස්සෙකු බවට පත්වන බවත්, තෝරා ගැනීමෙන් පසු දැනගතහොත් කිසිදු වන්දියක් නොගෙවා සේවයෙන් පහ කිරීමට යටත් වන බවත් පැහැදිලිව දන්වමි.

................................
අයදුම්කරුගේ අත්සන.

දිනය :................................

01-53

සංශෝධනයයි

**දඹුල්ල ප්‍රාදේශීය සභාව**

දෛනික වැටුප් ගෙවීමේ පදනම මත සේවයට බඳවා ගැනීම

"දඹුල්ල ප්‍රාදේශීය සභාවේ රියදුරු තනතුර, බර වාහන යන්ත්‍ර ක්‍රියාකරු තනතුර සහ බැකෝ ලෝඩර් ක්‍රියාකරු තනතුර සඳහා දෛනික වැටුප් ගෙවීමේ පදනමින් සේවකයන් බඳවා ගැනීම "

2025.11.28 දිනැති අංක 2465 දරන *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* පළ කරන ලද ඉහත බඳවා ගැනීමේ නිවේදනයේ අයදුම්පත් කැඳවීමේ අවසාන දිනය පහත පරිදි සංශෝධනය විය යුතුය :

1. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය **2026.01.16** දින දක්වා දීර්ඝ කරනු ලබන අතර ඉහත කී *ගැසට්* නිවේදනයේ සියලු කරුණු එලෙසින්ම බලපැවැත්වේ.

ඒ. එල්. එස්. ප්‍රියදර්ශනී,
ලේකම්,
දඹුල්ල ප්‍රාදේශීය සභාව,
සීගිරිය.

01-52/1

---

සංශෝධනයයි

**දඹුල්ල ප්‍රාදේශීය සභාව**

දෛනික වැටුප් ගෙවීමේ පදනම මත සේවයට බඳවා ගැනීම

"දඹුල්ල ප්‍රාදේශීය සභාවේ විදුලි කාර්මික තනතුර සඳහා සහ නළ ළිං කාර්මික තනතුර සඳහා දෛනික වැටුප් ගෙවීමේ පදනමින් සේවකයන් බඳවා ගැනීම "

2025.11.28 දිනැති අංක 2465 දරන *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* පළ කරන ලද ඉහත බඳවා ගැනීමේ නිවේදනයේ අයදුම්පත් කැඳවීමේ අවසාන දිනය පහත පරිදි සංශෝධනය විය යුතුය :

1. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය **2026.01.16** දින දක්වා දීර්ඝ කරනු ලබන අතර ඉහත කී *ගැසට්* නිවේදනයේ සියලු කරුණු එලෙසින්ම බලපැවැත්වේ.

ඒ. එල්. එස්. ප්‍රියදර්ශනී,
ලේකම්,
දඹුල්ල ප්‍රාදේශීය සභාව,
සීගිරිය.

01-52/2

---

සංශෝධනයයි

**දඹුල්ල ප්‍රාදේශීය සභාව**

දෛනික වැටුප් ගෙවීමේ පදනම මත සේවයට බඳවා ගැනීම

"දඹුල්ල ප්‍රාදේශීය සභාවේ මාර්ග කම්කරු (වැඩ ක්ෂේත්‍ර කම්කරු) තනතුර සඳහා සහ පුස්තකාල සහායක තනතුර සඳහා දෛනික වැටුප් ගෙවීමේ පදනමින් සේවකයන් බඳවා ගැනීම "

2025.11.28 දිනැති අංක 2465 දරන *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* පළ කරන ලද ඉහත බඳවා ගැනීමේ නිවේදනයේ අයදුම්පත් කැඳවීමේ අවසාන දිනය පහත පරිදි සංශෝධනය විය යුතුය :

1. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය **2026.01.16** දින දක්වා දීර්ඝ කරනු ලබන අතර ඉහත කී *ගැසට්* නිවේදනයේ සියලු කරුණු එලෙසින්ම බලපැවැත්වේ.

ඒ. එල්. එස්. ප්‍රියදර්ශනී,
ලේකම්,
දඹුල්ල ප්‍රාදේශීය සභාව,
සීගිරිය.

01-52/3

# පළාත් පාලන නිවේදන

## නුවරඑළිය මහා නගර සභාව

ගෝඝාතක ආඥාපනත

ගෝ ඝාතක ආඥාපනතේ 272 අධිකාරියේ 17(1) වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව නුවරඑළිය මහා නගර සභාවේ කොමසාරිස් කේ. එම්. එච්. ඩබ්. බණ්ඩාර වන මා විසින් 2026 වර්ෂය තුළ මෙහි පහත උපලේඛනයට අනුව එහි සඳහන් දිනයන්හිදී සහ රජය විසින් ප්‍රකාශයට පත් කරනු ලබන දිනයන් මා විසින් විටින් විට නිකුත් කරනු ලබන නියෝග අනුව වැසිය යුතු දිනයන්හි දී ද, නුවරඑළිය මහා නගර සභා බල ප්‍රදේශය තුළ සහ නානුඔය ගවඝාතකාගාරයද ඇතුලත්ව මස් පිණිස සතුන් මැරීම/මස් විකිණීම/මස් විකිණීම පිණිස ප්‍රදර්ශනය කොට තැබීම හා මස් වර්ග විකුණනු ලබන ස්ථාන විවෘත කොට තැබීම සපුරා තහනම් බව මෙයින් නිවේදනය කරමි.

*උපලේඛනය*

| | | | |
|---|---|---|---|
| 2026 | ජනවාරි | 03 සෙනසුරාදා | දුරුතු පුර පසළොස්වක පෝය දිනය |
| 2026 | ජනවාරි | 15 බ්‍රහස්පතින්දා | තෛපොංගල් දිනය |
| 2026 | ජනවාරි | 16 සිකුරාදා | තෛපොංගල් දිනට පසු දිනය |
| 2026 | පෙබරවාරි | 01 ඉරිදා | නවම් පුර පසළොස්වක පෝය දිනය |
| 2026 | පෙබරවාරි | 04 බදාදා | ජාතික නිදහස් දිනය |
| 2026 | පෙබරවාරි | 15 ඉරිදා | මහා ශිව රාත්‍රී දිනය |
| 2026 | මාර්තු | 02 සඳුදා | මැදින් පුර පසළොස්වක පෝය දිනය |
| 2026 | අප්‍රේල් | 01 බදාදා | බක් පුර පසළොස්වක පෝය දිනය |
| 2026 | අප්‍රේල් | 03 සිකුරාදා | මහ සිකුරාදා දිනය |
| 2026 | මැයි | 01 සිකුරාදා | වෙසක් පුර පසළොස්වක පෝය දිනය |
| 2026 | මැයි | 02 සෙනසුරාදා | වෙසක් පුර පසළොස්වක පෝය දිනය |
| 2026 | මැයි | 30 සෙනසුරාදා | අධි පොසොන් පුර පසළොස්වක පෝය දිනය |
| 2026 | ජූනි | 29 සඳුදා | පොසොන් පුර පසළොස්වක පෝය දිනය |
| 2026 | ජූලි | 29 බදාදා | ඇසළ පුර පසළොස්වක පෝය දිනය |
| 2026 | අගෝස්තු | 27 බ්‍රහස්පතින්දා | නිකිණි පුර පසළොස්වක පෝය දිනය |
| 2026 | සැප්තැම්බර් | 26 සෙනසුරාදා | බිනර පුර පසළොස්වක පෝය දිනය |
| 2026 | ඔක්තෝබර් | 04 ඉරිදා | ලෝක සත්ව දිනය |
| 2026 | ඔක්තෝබර් | 25 ඉරිදා | වප් පුර පසළොස්වක පෝය දිනය |
| 2026 | නොවැම්බර් | 08 ඉරිදා | දීපාවලි උත්සව දිනය |
| 2026 | නොවැම්බර් | 24 අඟහරුවාදා | ඉල් පුර පසළොස්වක පෝය දිනය |
| 2026 | දෙසැම්බර් | 23 සිකුරාදා | උඳුවප් පුර පසළොස්වක පෝය දිනය |

හා රජය විසින් ප්‍රකාශයට පත් කරන වෙනත් දිනයන්.

කේ. එම්. එච්. ඩබ්. බණ්ඩාර,
නාගරික කොමසාරිස්,
මහ නගර සභාව,
නුවරඑළිය.

2025 දෙසැම්බර් මස 23 දින,
නුවරඑළිය මහ නගර සභා කාර්යාලයේ දී ය.

01-66

## පූජාපිටිය ප්‍රාදේශීය සභාව

### 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(1) අ උපවගන්තිය යටතේ කරනු ලබන දැන්වීමයි.

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(1) අ උපවගන්ති ප්‍රකාර මධ්‍යම පළාතේ මහනුවර දිස්ත්‍රික්කයේ පූජාපිටිය ප්‍රාදේශීය සභාව විසින් පහත සඳහන් උපලේඛනයේ ඇති මාවත පූජාපිටිය සතු මාවත් වශයෙන් ප්‍රකාශයට පත් කිරීම 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 8.1 වගන්තිය ප්‍රකාරව මා වෙත පැවරී ඇති බලතල අනුව 2025 වර්ෂයේ නොවැම්බර් මස 11 මහසභාවේ තීරණ අංක ඉ 1.7 යටතේ පූජාපිටිය ප්‍රාදේශීය සභාව සතු මාවත් වශයෙන් ප්‍රකාශයට පත් කරනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

මේ පිළිබඳව ප්‍රදේශයේ පොදු ජනතාව විසින් මෙම මාර්ගයට අදාළ ඉඩම්වල අයිතිකරුවන් ලෙස හිමිකම් පාන පාර්ශවයන් යම් විරුද්ධත්වයක් පළ කරන්නේ නම් මෙම නිවේදනය *ගැසට් පත්‍රයේ* පළ වූ දින සිට එක් මාසයක් ඇතුළත තමන්ගේ අයිතිය ඔප්පු කිරීම 1987 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(2) වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

මෙම කාල සීමාව තුළ මෙම නිවේදනය පිළිබඳව යම් විරුද්ධත්වයක් ඉදිරිපත් නොවුනහොත් උපලේඛනයේ සඳහන් මංමාවත් පූජාපිටිය ප්‍රාදේශීය සභාව සතු මංමාවත් වශයෙන් පිළිගෙන පාලනය කරනු ලබන බව පොදු ජනතාවගේ දැන ගැනීම සඳහා ප්‍රකාශයට පත් කරමි.

සභාපති,
පූජාපිටිය ප්‍රාදේශීය සභාව,
පූජාපිටිය.

2025 දෙසැම්බර් මස 09 දින,
පූජාපිටිය ප්‍රාදේශීය සභාව.

1. මාර්ගයේ නම - වැවල පහළතැන්න මාර්ගය
2. ආරම්භය - ගල්ලැල්ල රුප්පවත්ත මාර්ගය
3. අවසානය - පී. කේ. දිසානායක නැමති අයගේ ඉඩම
4. ග්‍රාම නිලධාරී වසම - වැවල
5. පිඹුරු අංකය - 0498

| *වම්පස* | *දකුණු පස* | *මාර්ගයේ දිග* | *මාර්ගයේ පළල* |
|---|---|---|---|
| 01. ඩබ්. එම්. ජී. ටී. පී. වීරතිස්ස | 01. ඩබ්. එම්. ජී. ඩබ්. රණතුංග | 165m | 3.05m |
| 02. එච්. ඊ. ආර්. පී. යූ. දිසානායක | 02. එච්. ටී. ජී. එම්. නන්දාවතී | | |
| | 03. ඩබ්. එම්. ජී. ටී. පී. වීරතිස්ස | | |
| | 04. ඩබ්. එම්. ජී. ඒ. ගුණසිංහ | | |
| | 05. ඩී. ටී. පී. දයාවතී | | |
| | 06. එම්. ජී. ආරියදාස | | |
| | 07. එම්. ජී. වී. කරුණාරත්න | | |
| | 08. ඩබ්. ඩබ්. ජී. ආර්. ටී. එම්. රාජපක්ෂ | | |

M.R.P.K. KANDEKUMBURA
Registered Licensed Surveyor
Court Commissioner
Reg. No: 20182423
No. 212/7, Watagalatenna,
Dolapihilla
T.P. 0761610115

PLAN No: 0498




Scale 1:1000

# PLAN

of

An allotment of land marked lot 1 being portion of

"PAHALA TENNA"

Situated at

Wewala Village in Wewala South (503) GN Division

(Within Pujapitiya Secretarial Division & Pradeshiya Sabha Limits)

in Galasiyapattu of Harispattu

KANDY DISTRICT

C E N T R A L P R O V I N C E.

Entire land bounded as described above Containing in Extent

| Lot No | Extent | | | | Remarks |
|---|---|---|---|---|---|
| | Hec. | A. | R. | P. | |
| 4 | 0.0669 | 0 | 0 | 26.44 | 10 feet wide Road |

Boundaries pointed out by owners of the land

Surveyed on 28-JUN-2025

සත්‍ය පිටපති ඩබ්.එස්.පී. අයිරාංගනී
ප්‍රධාන කළමනාකරණ සේවා නිලධාරී
ප්‍රාදේශීය සභාව

1. මාර්ගයේ නම - කිරලගම ගම මැද මාර්ගය
2. ආරම්භය - ටි. ජී. එන්. එස්. වික්‍රමසිංහ නැමති අයගේ ඉඩම
3. අවසානය - හුසේන් නැමති අයගේ ඉඩම
4. ග්‍රාම නිලධාරී වසම - බමුණුපොල - අංක 544
5. පිඹුරු අංකය - 3417

| *වම්පස* | *දකුණු පස* | *මාර්ගයේ දිග* | *මාර්ගයේ පළල* |
|---|---|---|---|
| 01. දිල්ශාන් උපුල් කුමාර | 01. ටී. ජී. එන්. ජේ. වික්‍රමසිංහ | 180m | 2.40m |
| 02. නිෂාන්ත සුමිත් කුමාර | 02. සෙනරත් උඩවත්ත | | |
| 03. ප්‍රසන්න මධුමාධව ජයරත්න | 03. එම්. ජී. කරුණාවතී | | |
| 04. කුෂාන් හසේන්ද්‍ර සෙනරත් | 04. ආර්. ජී. ප්‍රේමලතා | | |
| 05. ආර්. ජී. උපාලි ජයරත්න | 05. ආර්. ජී. උපාලි ජයරත්න | | |
| 06. ආර්. ජී. ප්‍රදීප් කුමර වනිගසේකර | 06. ආර්. ජී. ප්‍රදීප් කුමාර වනිගසේකර | | |
| 07. අයි. ඒ. ෂෙල්ටන් සිල්වා | 07. අයි. ඒ. ෂෙල්ටන් සිල්වා | | |
| 08. එම්. ජී. සරත් රාජරත්න | 08. ටී. ජී. සෙනරත් වීරරත්න | | |
| 09. එම්. ජී. තිලකසිරි | 09. ටී. ජී. රවීන්ද්‍ර වීරරත්න | | |
| 10. ආර්. එම්. වසන්ත කුමාර | 10. ආර්. ජී. විමලසේන | | |
| 11. සලීම් | 11. හුසේන් | | |
| 12. හුසේන් | | | |



0.03993
15.79

1. මාර්ගයේ නම - දැලමංකඩ මාර්ගය
2. ආරම්භය - R. D. A. මාර්ගයට
3. අවසානය - එච්. එම්. පී. කේ. නවරත්න නැමති අයගේ ඉඩම
4. ග්‍රාම නිලධාරී වසම - හේනේගම
5. පිඹුරු අංකය - 2568

| *වම්පස* | *දකුණු පස* | *මාර්ගයේ දිග* | *මාර්ගයේ පළල* |
|---|---|---|---|
| 01. ඩබ්. එම්. එස්. කේ. වීරපාන | 01. එච්. එම්. එන්. ඩබ්. පී. කේ. නවරත්න | 103m | 3.05m |
| 02. බී. එම්. පී. කේ. නවරත්න | 02. ආර්. ඒ. ඩබ්. එම්. කේ. ශ්‍රී විජේකෝන් | | |
| 03. ඩබ්. එම්. එස්. එස්. වීරකෝන් | 03. ඩී. එම්. කේ. බී. දිසානායක | | |
| 04. එච්. එම්. පී. කේ. නවරත්න | 04. එම්. එම්. කේ. කේ. හිඟුල්වල | | |
| | 05. ඩබ්. ඒ. එස්. කුමාරි | | |
| | 06. එච්. එම්. ඩබ්. එන්. කේ. නවරත්න | | |

**W.M.G.K. Wijesinghe**
Registered Licensed Surveyor, Leveller
& Court Commissioner
(Land Survey Council Regd. No.19921656)
No. 23/A/1, Kahalla,
Katugastota.
Tele. 081-2499272
071-4455907
077-6777736

**PLAN NO : 2568**
Extract of lots 1, 2 & 5




Reference

St : Stake
LF : Live Fence
BW : Boundary Wall
WLF : Wire Live Fence
RW : Retaining Wall
P : Permanent building
CP : Concrete Post
EP : Electricity Post
TP : Telephone Post
EDn : Earth Drain
Road(RDA) : Road(Road Development Authority)

Scale 1:1000

**PLAN**
of

Three allotments of land called
Mahawatte Gedara Aramba
Being re-survey & sub-division existing boundaries of part of lot 2 in Plan No.716/4
by W.A.Piyadasa, Liced. Surveyor (Plan not produced)
Situated at Molagoda in Galasiyapattu of Harispattu

**KANDY DISTRICT**
**CENTRAL PROVINCE**

| Lot No | Extent | | | | Remarks |
|---|---|---|---|---|---|
| | Hec. | A | R | P | |
| 1 | 0.0379 | 00 | 0 | 15.00 | ———— |
| 2 | 0.0119 | 00 | 0 | 04.70 | 10 Ft. wide access with 30 Ft. diameter turining circle |
| 5 | 0.0013 | 00 | 0 | 00.50 | 2 Ft. drain |

sgd./
**W.M.G.K. Wijesinghe**
Registered Licensed Surveyor, Leveller
& Court Commissioner.
'True extract of lots 1, 2 & 5 by me'

Issued on 13.02.2021

W. M. G. K. WIJESINGHE
Regd. Licensed Surveyor
& Court Commissioner
L. S. C. Regd. No 19921656
No. 23/A/1, Kahalla, Katugastota
081-2499272, 071-4455907
077-6777736

Surveyed on 04.02.2021
Boundaries surveyed as shown by owners.

සත්‍ය පිටපතකි
ප්‍රධාන කළමනාකරු
ප්‍රාදේශීය සභාව

1. මාර්ගයේ නම - නව ගලගම මාර්ගය
2. ආරම්භය - රජයේ රක්ෂිත ඉඩම
3. අවසානය - එස්. ජී. එම්. ඩී. විජේසිංහ නැමති අයගේ ඉඩම
4. ග්‍රාම නිලධාරී වසම - එගොඩමුල්ල උතුර
5. පිඹුරු අංකය - 0276

මාර්ගයේ ආරම්භයේ සිට අවසානය දක්වා වම්පස සහ දකුණු පස

| *වම්පස* | *දකුණු පස* | *මාර්ගයේ දිග* | *මාර්ගයේ පළල* |
|---|---|---|---|
| 01. රජයේ රක්ෂිත ඉඩම | 01. රජයේ රක්ෂිත ඉඩම | 1000m | 2.40m |
| 02. කේ. විජේසිංහ | 02. ටී. ජී. ආර්. ධර්මසේන | | |
| 03. එම්. ජී. මාලනී | 03. අයි. ජී. ටී. පී. ධර්මසිරි | | |
| 04. අයි. ජී. කේ. ඒ. ජයරත්න | 04. සිරිල් | | |
| 05. එම්. ජී. ජයසිංහ | 05. ඒ. ජී. ඒ. විජේසිංහ | | |
| | 06. ජී. ජී. ආර්. ජයලාල් | | |
| | 07. එස්. ජී. එම්. ඩී. විජේසිංහ | | |

K.M.P.P.K. KANDEKUMBURA
Registered Licensed Surveyor
Court Commissioner
Reg. No: 20182423
No. 212/7, Watagalatenna,
Dolapihilla
T.P. 0761610115

PLAN No: 0276




Scale 1:2000

PLAN

of

An allotment of land marked lot 1 being portion of

"ANKUMBURA ESTATE"

Re-Survey of part of lots 12, 24, 38 & 40 in plan no.325 dated 01-30.05.1998 made by S.P.H.Tennakoon L/S

Situated at

Ihalamulla Villege in Egodamulla North(531) GN Division

in Pallegampaha of Harispattu

KANDY DISTRICT

C E N T R A L P R O V I N C E.

Entire land bounded as described above Containing in Extent

| Lot No | Extent | | | | Remarks |
|---|---|---|---|---|---|
| | Hec. | A. | R. | P. | |
| 1 | 0.2236 | 0 | 2 | 08.40 | Min. 12ft. wide Road |

Boundaries pointed out by owners of the adjoining lands

Surveyed on 30-DEC-2024

සත්‍ය පිටපත
එච්.එස්.පී. අයිරාංගනී
ප්‍රධාන කළමණාකරන සේවා නිලධ...
ප්‍රාදේශීය සභාව
පූජාපිටිය.

1. මාර්ගයේ නම - වැල්ගාල අඹකණුව අමුණේවල මාර්ගය
2. ආරම්භය - ටී. එම්. රණසිංහ බණ්ඩා නැමති අයගේ ඉඩම
3. අවසානය - ටී. එම්. ඩිංගිරි බණ්ඩා නැමති අයගේ ඉඩම
4. ග්‍රාම නිලධාරී වසම - වැල්ගාල
5. පිඹුරු අංකය - 17637

මාර්ගයේ ආරම්භයේ සිට අවසානය දක්වා වම්පස සහ දකුණු පස

| *වම්පස* | *දකුණු පස* | *මාර්ගයේ දිග* | *මාර්ගයේ පළල* |
|---|---|---|---|
| 01. ටී. එම්. රණසිංහ බණ්ඩා | 01. ලයනල් සෝමරත්න | 250m | 2.40m |
| 02. ටී. එම්. තිස්ස රම්බණ්ඩා | 02. ටී. එම්. තිස්ස රම්බණ්ඩා | | |
| 03. ආර්. රම්බණ්ඩා | 03. ආර්.අමරකෝන් | | |
| 04. එස්. එම්. රණසිංහ බණ්ඩා | 04. ඒ. එම්. විජේරත්න | | |
| 05. එස්. එම්. සෙනවිරත්න | 05. ඒ. එම්. ජයරත්න බණ්ඩා | | |
| 06. ටී. එම්. ඩිංගිරි බණ්ඩා | 06. ටී. එම්. දසනායක | | |
| | 07. ටී. එම්. ඩිංගිරි බණ්ඩා | | |

B.S. SANGARANDENIYA
Registered Licensed Surveyor
No.61/A, Veralugas Anga
Dambakotuwa
Kengalla

PLAN No: 17637




Scale 1:1000

PLAN

of

An allotment of land marked lot 1 being portion of

"PANGOLLE WATTA, AMUNAYA KUMBURA, AHELAGAHAMULA WATTA & PUSSEHENA WATTA"

Situated at

Walgala Villege in Walgala GN Division

in Pallegampaha of Harispattu

KANDY DISTRICT

C E N T R A L P R O V I N C E.

Bounded as described above Containing in Extent

| Lot No. | Extent | | | | Remarks |
|---|---|---|---|---|---|
| | Hec. | A. | R. | P. | |
| | 0.0660 | 0 | 0 | 26.08 | |

Boundaries pointed out by owners of the lands
Surveyed on 04-OCT-2020

සත්‍ය පිටපතකි

## කුලියාපිටිය ප්‍රාදේශීය සභාව

ගෝ ඝාතක ආඥාපනත 272 අධිකාරිය යටතේ කරන දැන්වීමයි

මෙහි පහත දැක්වෙන උපලේඛනයේ නම සඳහන් වන අය විසින් ඔහුගේ නමට ඉදිරියෙන් සඳහන් කර ඇති ස්ථානයෙ හි 2026 වර්ෂය සඳහා ගව ඝාතකාගාරයක් පවත්වාගෙන යාම සඳහා බලපත්‍රයක් ඉල්ලමින් අයදුම්පත්‍රයක් මා වෙත ඉදිරිපත් කර ඇති බවත් එම බලපත්‍රය නිකුත් කිරීම සම්බන්ධයෙන් කුලියාපිටිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පදිංචි යම් අයෙකු විරුද්ධ වන්නේ නම් එසේ විරුද්ධ වීමට හේතුව ලිඛිතව පිටපත් දෙකකින් යුක්තව මෙම දැන්වීම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* IV(අ) කොටසේ පළ වූ දින සිට දින 21 ක් ඇතුළත මා වෙත දන්වා එවිය යුතු බවත් ගෝ ඝාතක ආඥාපනතේ 272 අධිකාරියේ අංක 7(2) වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

**උපලේඛනය**

| *ඉල්ලුම්කරුගේ නම හා ලිපිනය* | *ස්වභාවය* | *ඉදිකරන ස්ථානය* |
|---|---|---|
| ජුනයිදීන් සෆීල්,<br>මැටිවැව,<br>කැකුණගොල්ල | ගව ඝාතකාගාරයක් | අංක 7852 සහ 2017/08/04 දිනැති ඔප්පුවේ සඳහන් කුරුණෑගල දිස්ත්‍රික්කටුයේ ගම්පොල හත්පත්තුව මැද්දේ කැටිය කෝරළයේ මැටිවැව පිහිටි පිඹුරු අංක 4164/2017 හි ලොට් අංක 01 දරන කෝන්ගහමුලවත්ත නැමැති ඉඩම. |

ආර්. එම්. විජයසිරි ඒකනායක,
සභාපති,
කුලියාපිටිය ප්‍රා දේශීය සභාව,
කුලියාපිටිය.

2025 දෙසැම්බර් මස 15 දින,

01-185/1

---

## කුලියාපිටිය ප්‍රාදේශීය සභාව

ගෝ ඝාතක ආඥාපනත 272 අධිකාරිය යටතේ කරන දැන්වීමයි

මෙහි පහත දැක්වෙන උපලේඛනයේ නම සඳහන් වන අය විසින් ඔහුගේ නමට ඉදිරියන් සඳහන් කර ඇති ස්ථානයෙ හි 2026 වර්ෂය සඳහා ගව ඝාතකාගාරයක් පවත්වාගෙන යාම සඳහා බලපත්‍රයක් ඉල්ලමින් අයදුම්පත්‍රයක් මා වෙත ඉදිරිපත් කර ඇති බවත් එම බලපත්‍රය නිකුත් කිරීම සම්බන්ධයෙන් කුලියාපිටිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පදිංචි යම් අයෙකු විරුද්ධ වන්නේ නම් එසේ විරුද්ධ වීමට හේතුව ලිඛිතව පිටපත් දෙකකින් යුක්තව මෙම දැන්වීම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* IV(අ) කොටසේ පළ වූ දින සිට දින 21 ක් ඇතුළත මා වෙත දන්වා එවිය යුතු බවත් ගෝ ඝාතක ආඥාපනතේ 272 වන අධිකාරියේ අංක 7(2) වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

**උපලේඛනය**

| *ඉල්ලුම්කරුගේ නම හා ලිපිනය* | *ස්වභාවය* | *ඉදිකරන ස්ථානය* |
|---|---|---|
| ෆාසීර් මොහාම්මදු ෆස්ලුන්,<br>ඒදණ්ඩේවෙල,<br>වැවගම | ගව ඝාතකාගාරයක් | අංක 343 සහ 2018/10/29 දිනැති ඔප්පුවේ සඳහන් කුරුණෑගල දිස්ත්‍රික්කයේ කටුගම්පොල හත්පත්තුව මයුරාවතී කෝරලයේ ඒදණ්ඩේවෙල පිහිටි පිඹුරු අංක 118/2018 හි ලොට් අංක 01 සහ 02 දරන කොස්ගහමුලවත්ත නැමැති ඉඩම |

ආර්. එම්. විජයසිරි ඒකනායක,
සභාපති,
කුලියාපිටිය ප්‍රාදේශීය සභාව,
කුලියාපිටිය.

2025 දෙසැම්බර් මස 15 දින,

01-185/2

## කුලියාපිටිය ප්‍රාදේශීය සභාව

ගෝ ඝාතක ආඥාපනත 272 අධිකාරිය යටතේ කරන දැන්වීමයි

මෙහි පහත දැක්වෙන උපලේඛනයේ නම සඳහන් වන අය විසින් ඔහුගේ නමට ඉදිරියෙන් සඳහන්කර ඇති ස්ථානයෙහි 2026 වර්ෂය සඳහා ඌරු මස් අලෙවිසැලක් සහ ඌරු මස් ඝාතකාගාරයක් පවත්වාගෙන යාම සඳහා බලපත්‍රයක් ඉල්ලමින් අයදුම්පත්‍රයක් මා වෙත ඉදිරිපත් කර ඇති බවත් එම බලපත්‍රය නිකුත් කිරීම සම්බන්ධයෙන් කුලියාපිටිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පදිංචි යම් අයෙකු විරුද්ධ වන්නේ නම් එසේ විරුද්ධවීමට හේතුව ලිඛිතව පිටපත් දෙකකින් යුක්තව මෙම දැන්වීම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* IV(අ) කොටසේ පළ වූ දින සිට දින 21 ක් ඇතුළත මා වෙත දන්වා එවිය යුතු බවත් ගෝ ඝාතක ආඥාපනතේ 272 වන අධිකාරියේ අංක 7(2) වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

### උපලේඛනය

| *ඉල්ලුම්කරුගේ නම හා ලිපිනය* | *ස්වභාවය* | *ඉදිකරන ස්ථානය* |
|---|---|---|
| ඩබ්. එන්. දිල්ශාන් පෙරේරා,<br>දෙලන,<br>තලාකොලහේන | ඌරු මස් අලෙවිසැල සහ ඝාතකාගාරය | අංක 9340 සහ 2016/02/29 ඔප්පුවේ සඳහන් කුරුණෑගල දිස්ත්‍රික්කයේ කටුගම්පොල හත්පත්තුවේ යටිකහ කෝරලයේ දෙලන පිහිටි මාවතහේන වත්ත හෙවත් මහගෙදරවත්ත ඉඩම |

ඊ. එම්. විජයසිරි ඒකනායක,
සභාපති,
කුලියාපිටිය ප්‍රා දේශීය සභාව,
කුලියාපිටිය.

2025 දෙසැම්බර් මස 15 දින,

01-185/3

---

## කුලියාපිටිය ප්‍රාදේශීය සභාව

ගෝ ඝාතක ආඥාපනත 272 අධිකාරිය යටතේ කරන දැන්වීමයි

මෙහි පහත දැක්වෙන උපලේඛනයේ නම සඳහන් වන අය විසින් ඔහුගේ නමට ඉදිරියෙන් සඳහන් කර ඇති ස්ථානයෙහි 2026 වර්ෂය සඳහා ගව ඝාතකාගාරයක් පවත්වාගෙන යාම සඳහා බලපත්‍රයක් ඉල්ලමින් අයදුම්පත්‍රයක් මා වෙත ඉදිරිපත්කර ඇති බවත් එම බලපත්‍රය නිකුත් කිරීම සම්බන්ධයෙන් කුලියාපිටිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පදිංචි යම් අයෙකු විරුද්ධ වන්නේ නම් එසේ විරුද්ධවීමට හේතුව ලිඛිතව පිටපත් දෙකකින් යුක්තව මෙම දැන්වීම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* IV(අ) කොටසේ පළ වූ දින සිට දින 21 ක් ඇතුළත මා වෙත දන්වා එවිය යුතු බවත් ගෝ ඝාතක ආඥාපනතේ 272 වන අධිකාරියේ අංක 7(2) වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

### උපලේඛනය

| *ඉල්ලුම්කරුගේ නම හා ලිපිනය* | *ස්වභාවය* | *ඉදිකරන ස්ථානය* |
|---|---|---|
| ආදම්පුල්ලේ ජෙස්මි<br>මඩලැස්ස,<br>කැකුණගොල්ල | ගව ඝාතකාගාරයක් | අංක 9526 සහ 2019/02/25 දිනැති ඔප්පුවේ සඳහන් කුරුණෑගල දිස්ත්‍රක්කයේ කටුගම්පොල හත්පත්තුව මැද්දෙකැටිය කෝරලයේ මඩලස්ස පිහිටි පිඹුරු අංක 558/0219 හි ලොට් අංක 01 දරන යාපාහාමිගේ වත්ත නැමැති ඉඩම. |

ඊ. එම්. විජයසිරි ඒකනායක,
සභාපති,
කුලියාපිටිය ප්‍රා දේශීය සභාව,
කුලියාපිටිය.

2025 දෙසැම්බර් මස 15 දින,

01-185/4

# විවිධ දැන්වීම්

## කතරගම ප්‍රාදේශීය සභාව

2026 කතරගම හා සෙල්ල කතරගම පිහිටුවා ඇති සතිපොළවලින් ගාස්තු අය කිරීම

කතරගම ප්‍රාදේශීය සභාවේ දී 2025.11.02 පැවති මුදල් හා ප්‍රතිපත්ති උපදේශක කමිටුවේ අංක 10 යටතේ 2025.12.19 දින පවත්වන ලද මහා සභාවේ අනුමැතිය අනුව තීරණ අංක ඊ යටතේ පහත දැක්වෙන යෝජනාව සිදු කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

එච්. එම්. ඩී. හේරත්,
සභාපති,
ප්‍රාදේශීය සභාව- කතරගම

2025 දෙසැම්බර් මස 19 දින,
ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

### යෝජනාව

1987 අංක 15 ප්‍රාදේශීය සභා පනතේ බලතල අනුව කතරගම ප්‍රාදේශීය සභාව විසින් නඩත්තු කර පාලනය කරනු ලබන කතරගම / සෙල්ල කතරගම පිහිටුවා ඇති සති පොළවල වෙන් කර ඇති වෙළඳ බිම් වලින් වර්ග අඩියකට රු. 10.00 ක් වන පරිදි සහ කතරගම සතිපොලේ මුහුදු මාළු හෝ වැව් මාළු හා මස් වෙළඳාම සඳහා විශේෂයෙන් ඉදි කරන ලද කුටි තුළ වෙළඳාම් කරන විට එක් වෙළෙන්දෙකුගෙන් එක් කුටියක් සඳහා රු. 1,800.00 ක් වනපරිදි ගාස්තු අයකර ලදු පතක් නිකුත් කිරීම විය යුතු බවට ගරු සභාව වෙත මා විසින් යෝජනා කරමි.

01-45

---

## හික්කඩුව නගර සභාව

හික්කඩුව නගර සභා බල සීමාව තුළ කසල බද්ද පැනවීම

255 අධිකාරය නගර සභා ආඥාපනතේ 19(3) වගන්තියෙන් හික්කඩුව නගර සභාවේ සභාපති වන පිලානෙ ගාර්දියෙ ගොඩකන්දගේ යසස්වින් වන මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව මවිසින් 2025.08.20 දිනැති තීරණ අංක (ඉ) 33 යටතේ පහත උපලේඛනයහි දක්වා ඇති කසල බද්ද 2026.01.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි හික්කඩුව නගර සභා සීමාව තුළ ක්‍රියාත්මක කිරීමට තීරණය කළ බව මෙයින් නිවේදනය කරමි.

පිලාන ගාර්දියෙ ගොඩකන්දගේ යසස්වින්,
සභාපති,
නගර සභාව, හික්කඩුව.

2025 දෙසැම්බර් මස 11 දින,
හික්කඩුව නගර සභා කාර්යාලයේ දී ය.

### උපලේඛනය

1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂංගික විධිවිධාන) පනතේ 2 වගන්තිය සමඟ කියවිය යුතු 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 2 වගන්තිය යටතේ, දකුණු පළාත් පාලන විෂය භාර අමාත්‍යවරයා විසින් සම්පාදනය කරන ලදුව, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2013.10.25 දිනැති අංක 1834 දරන *ගැසට් පත්‍රයේ* පළ කරන ලද, 255 වන අධිකාරය වන නගර සභා ආඥාපනතේ 153 වගන්තිය සමග කියවිය යුතු එම ආඥාපනතේ 118 වගන්තිය සහ 157(9) 9(ආ) සහ 157(9) (ඇ) උපවගන්ති සහ 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 3 වැනි වගන්තිය යටතේ හික්කඩුව නගර සභාව විසින් පිළිගෙන වැළඳගත් සහ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2025.01.24 දිනැති අංක 2421 දරන *ගැසට් පත්‍රයේ* පළ කරන ලද දැන්වීමකින් එසේ පිළිගෙන වැළඳගත් බවටත් 2025.01.24 දින සිට ක්‍රියාත්මක කරන බවටත් ප්‍රසිද්ධ කරන ලද

ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ සම්මත අතුරු ව්‍යවස්ථා ප්‍රකාරව, 2025.08.20 දින පැවති හික්කඩුව නගර සභා මාසික රැස්වීමේ තීරණ අංක (ඉ) 33 දරන සභා තීරණය පරිදි පහතින් දක්වන ආකාරයට හික්කඩුව නගර සභා සීමාව තුල පිහිටි සියලුම ව්‍යාපාරික ස්ථාන වලින් 2026.01.01 දින සිට ක්‍රියාත්මක වන ලෙස කසළ බද්දක් අය කරන බව මෙයින් නිවේදනය කරමි.

1) කසල ලෝඩ් 01 ක් සඳහා අය කරන ගාස්තුව රු. 6,000.00 යි

2) කසල ලෝඩ් එකක් යනුවෙන් අදහස් කරන කසල ප්‍රමාණය ට්‍රැක්ටර් ලෝඩ් 01 කි. (කියුබ් 01/ඝණ අඩි 100)

3) කසල බද්ද අය කරනු ලබන්නේ මාසිකවය.

01-64

---

සංශෝධනයයි

**හික්කඩුව නගර සභාව**

2026 වර්ෂය සඳහා වූ ජල බවුසර් ගාස්තු හා සංචාරක කාමරයන්හි ගාස්තු සංශෝධනය

2025.11.28 දින 2465 පළ වූ *ගැසට්* නිවේදනයේ පළ කරන ලද 2026 වර්ෂය සඳහා හික්කඩුව නගර සභාවේ බදු හා බලපත්‍ර පැනවීමේ නිවේදනයේ ජල බවුසර් ගාස්තු හා සංචාරක කාමර ගාස්තු 2025.11.19 දින පැවති මාසික මහ සභා රැස්වීමේ තීරණ අංක (ඉ) 1.27 යටතේ පහත පරිදි 2026.01.01 දින සිට සංශෝධනය වන බවට මෙයින් නිවේදනය කරමි..

නිතිඥ යසස්වින් ගොඩකන්ද,
සභාපති,
හික්කඩුව නගර සභාව.

| ලීටර 3,500 ජල බවුසරය | | ලීටර 5,000 ජල බවුසරය | |
|---|---|---|---|
| හික්කඩුව නගර සභා බල ප්‍රදේශය තුළ | රු. 6,000.00 | හික්කඩුව නගර සභා බලප්‍රදේශය තුල | රු. 8,500.00 |
| ජල බවුසරය රඳවා ගැනීම (දිනකට) | | | රු. 2,500.00 |
| හික්කඩුව නගර සභා සීමාවෙන් පිටත වැඩිවන කිලෝමීටර් එකකට | | | රු. 250.00 |
| පොදු කටයුතු සඳහා ජල බවුසර් එක | | | රු. 1,000.00 |

| | **හික්කඩුව නගර සභාවේ සංචාරක කාමර දිනක් සඳහා ගාස්තු** | රු. |
|---|---|---|
| I | කාමර අංක 01, 02 හා 03 සඳහා (ඍජුව සභාව වෙත පැමිණෙන අය සඳහා) | 6,000.00 |
| II | කාමර අංක 01, 02 හා 03 සඳහා (Booking.com හරහා අය සඳහා) | 7,000.00 |
| III | කාමර අංක 04සඳහා (උපරිම ආගන්තුකයන් පස් දෙනෙක් සඳහා) | 6,000.00 |
| IV | කාමර අංක 04 සඳහා (ආගන්තුකයන් පස් දෙනෙකුට වඩා වැඩි වන අවස්ථාවක එක් පුද්ගලයෙක් සඳහා) | 1,500.00 |

01-67

**කොට්කාවත්ත මුල්ලේරියාව ප්‍රාදේශීය සභාව**

වරිපනම් බදු පැනවීම - 2026

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 146 වගන්තියේ (1) උපවගන්තිය යටතේ කොටිකාවත්ත මුල්ලේරියාව ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාර 2025 දෙසැම්බර් මස 30 දින පවත්වන ලද කොටිකාවත්ත මුල්ලේරියාව ප්‍රාදේශීය සභා විශේෂ මහ සභා රැස්වීමේ දී (ඊ) i යටතේ පහත සඳහන් යෝජනාව සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

ඩබ්. ජී. ධනුෂ්ක ප්‍රියදර්ශන,
සභාපති,
කොටිකාවත්ත මුල්ලේරියාව ප්‍රාදේශීය සභාව.

2025 දෙසැම්බර් මස 30 දින,
ගොතටුව නව නගරය,
කොටිකාවත්ත මුල්ලේරියාව ප්‍රාදේශීය සභාවේ දී ය.

**යෝජනාව**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 146 වගන්තියේ (1) උපවගන්තියෙන් කොටිකාවත්ත මුල්ලේරියාව ප්‍රාදේශීය සභාවේ ලේකම් වන මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, කොටිකාවත්ත මුල්ලේරියාව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත පිහිටි සියලුම නිවාසවල, ගොඩනැගිලිවල, ඉඩම්වල, ගෙපත්වල 2026 වර්ෂයේ වාර්ෂික වටිනාකම සඳහා 2025 වර්ෂයේ භාවිත තක්සේරුව 2026 වර්ෂය සඳහා පිළිගැනීමටත්,

එකී තක්සේරුව මත 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර එකී දේපළ මත ඉහත කී වාර්ෂික වටිනාකමින් 9% වරිපනම් බද්දක් පනවා අයකළ යුතු බවත්,

තව ද, 2026 වර්ෂයේ පහත උපලේඛනයේ සඳහන් එක් එක් කාර්තුව වෙනුවෙන් ඉදිරියෙන් නිරූපිත දිනයට පෙර එසේ නියම කරන ලද වාර්ෂික වරිපනම් බද්ද කොටිකාවත්ත මුල්ලේරියාව ප්‍රාදේශීය සභා අරමුදලට ගෙවිය යුතු බවත්, එලෙස වාර්ෂික වරිපනම් බද්ද 2026 වර්ෂයේ ජනවාරි මස 31 වැනි දින හෝ ඊට ප්‍රථම ගෙවන්නේ නම්, වාර්ෂික වරිපනම් බද්දේ ප්‍රමාණයෙන් සියයට දහයක් (10%) ක වට්ටමක් ද, එකී උපලේඛනයේ එක් එක් කාර්තුව ඉදිරියෙන් III වැනි තීරුවේ නිරූපිත දිනයට පෙර අදාළ වරිපනම් බදු මුදල කොටිකාවත්ත මුල්ලේරියාව ප්‍රාදේශීය සභා අරමුදලට ගෙවනු ලබන්නේ නම් එක් කාර්තුවකට අදාළ මුදලින් 5% ක වට්ටමක් ද කොටිකාවත්ත මුල්ලේරියාව ප්‍රාදේශීය සභාව ලබාදිය යුතු බවත් මම තීරණය කරමි.

**උපලේඛනය**

| *I තීරුව*<br>*කාර්තුව* | *II තීරුව*<br>*ගෙවිය යුතු දිනය* | *III තීරුව*<br>*වට්ටම සඳහා හිමිකම් ලබන අවසාන දිනය* |
|---|---|---|
| පළමුවන කාර්තුව | 2026.03.31 | 2026.01.31 |
| දෙවන කාර්තුව | 2026.06.30 | 2026.04.30 |
| තුන්වන කාර්තුව | 2026.09.30 | 2026.07.31 |
| හතරවන කාර්තුව | 2026.12.31 | 2026.10.31 |

01 - 74/1

## කොටිකාවත්ත මුල්ලේරියාව ප්‍රාදේශීය සභාව

බලපත්‍ර ගාස්තු පැනවීම - 2026

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 147 හා 149 වන වගන්ති යටතේ කොටිකාවත්ත මුල්ලේරියාව ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාර 2025 වර්ෂයෙහි දෙසැම්බර් මස 30 දින පවත්වන ලද කොටිකාවත්ත මුල්ලේරියාව ප්‍රාදේශීය සභා විශේෂ මහ සභා රැස්වීමේ දී (ඊ) ii යටතේ පහත සඳහන් යෝජනාව සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

ඩබ්. ජී. ධනුෂ්ක ප්‍රියදර්ශන,
සභාපති,
කොටිකාවත්ත මුල්ලේරියාව ප්‍රාදේශීය සභාව.

2025 දෙසැම්බර් මස 30 දින,
ගොතටුව නව නගරය,
කොටිකාවත්ත මුල්ලේරියාව ප්‍රාදේශීය සභාව.

### යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 147 වගන්තිය හා 149 වන වගන්තිය යටතේ ප්‍රාදේශීය සභාවේ ලේකම් වන මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර එකී පනතේ හෝ එකී පනත යටතේ සාදන ලද අතුරු ව්‍යවස්ථාවක විස්තර කර ඇති මෙහි පහත උපලේඛනයෙ හි I වැනි තීරුවේ නිරූපිත යම් කාර්යයක් සඳහා කොටිකාවත්ත මුල්ලේරියාව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත යම් ස්ථානයක් හෝ පරිශ්‍රයක් පාවිච්චි කිරීමට බලය දෙමින්, 2026 වර්ෂයේ නිකුත් කරනු ලබන යම් බලපත්‍රයක් සම්බන්ධයෙන් එම උපලේඛනයෙහි II වැනි තීරුවේ අනුරූප සටහනේ නිරූපිත බලපත්‍ර ගාස්තුවක් පනවා අය කළ යුතු යැයි යෝජනා කරමි.

තව ද, එකී ස්ථානය හෝ පරිශ්‍රය 1968 අංක 14 දරන සංචාරක මණ්ඩල පනතේ කාර්යය සඳහා සංචාරක මණ්ඩලයේ අනුමත කර ඇති, පිළිගෙන ඇති හෝටලයක්, ආපන ශාලාවක්, නවාතැන්පළක් වන විටදී ඊට අදාළ බලපත්‍ර ලබාදීමේ දී එම ස්ථානයේ හෝ පරිශ්‍රයේ 2025 වර්ෂයේ ලැබීම්වලින් 1% ක් බලපත්‍ර ගාස්තුව ලෙස 2026 වර්ෂය සඳහා නියම විය යුතු බවට යෝජනා කරමි..

### උපලේඛනය

| | *I තීරුව* | *II තීරුව* | | |
|---|---|---|---|---|
| | *බලය දෙනු ලබන කාර්යය* | *වාර්ෂික වටිනාකම රු. 750 නොඉක්මවන අවස්ථාවක රු. ශත* | *වාර්ෂික වටිනාකම රු. 750 ඉක්මවන එහෙත් රු. 1,500 නොඉක්මවන අවස්ථාවක රු. ශත* | *වාර්ෂික වටිනාකම රු. 1,500 ඉක්මවන අවස්ථාවක රු. ශත* |
| 1. | බේකරියක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 2. | හෝටලයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 3. | ලැගුම්හලක් හෝ නවාතැන් ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 4. | භෝජන ශාලාවක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 5. | මාළු විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 6. | සංචාරක වෙළඳාමක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 7. | මස් වෙළඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 8. | අවමංගල්‍ය සේවා සැපයීම | 500 0 | 750 0 | 1,000 0 |
| 9. | ආහාර විකිණීම | 500 0 | 750 0 | 1,000 0 |

| | I තීරුව | II තීරුව | | |
|---|---|---|---|---|
